# දුසිරිත පැතිරීම

අප පසුගිය ලිපි කිහිපයෙන් තහවුරු කිරීමට උත්සාහ කෙළේ පැරණි සිංහලයන් අතර පැවති විවාහය ලිහිල් එකක් නොවූ බව ය. අද මෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මගින් සංස්ථාපිත විවාහ ලියා පදිංචිකිරීමක් එකල නො වුව ද විවාහයට එකල සිරිතට අනුව වලංගු භාවයක් තිබුණි. එකගෙයි කෑම වැනි සිරිතක් විශේෂිතයක් වූ පැරණි සිංහල සමාජයෙහි එක් පුරුෂයකුට එක් භාර්යාවක් පමණක් වීම සාමාන්‍යය විය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අනුව ලියා පදිංචි නොවීනිය යන්නෙන් එකට ජීවත්වීමක් (living together) අදහස් නො වී ය. එකට ජීවත්වීම යන සංකල්පය ඇතිවීමට පෙර බටහිර අර්ථයේ ලියා පදිංචියක් තිබිය යුතු විය.

එකල අපේ නීති පද්ධතිය සිරිත් යනුවෙන් හැඳින්විණි. සිරිත් ලේනා යන නිලය අද දවසේ නම් නීතිපති වැනි ධුරයක් විය. සිරිත් ලේනා යනු සිරිත් ලේකම්වරුන්ගේ නායකයා හෙවත් ප්‍රධානියා විය. එකල විවාහය සිංහල සිරිතට අනුව කෙරිණි. එය අද භාෂාවෙන් නම් යම් ලියා පදිංචිකිරීමක් විය. එහෙත් අප සෑමවිටකම මතක තබාගතයුත්තක් නම් සිංහල සිරිතට අනුව විවාහවීම හා විවාහය ලියා පදිංචිකිරීම එකම ක්‍රියාවලියක් නොව දෙකක් බව ය.. ඒ ඒ සංස්කෘතියෙහි දැනුම නිර්මාණය කෙරෙන්නේ ඒ ඒ ආකාරයට ය. එලෙසම සිරිත් විරිත් ද ඒ ඒ සංස්කෘතියෙහි වෙනස් වෙයි. එපමණක් නොව පාරිභාෂික වචන ද ඒ ඒ සන්දර්ශයෙහි වෙනස අරුත් ගනියි. අපට විවාහ සිරිත් යනු හුදු සිරිත් පමණක් නො වී ය. එහි අද බටහිරයන් යොදාගන්නා ආකාරයෙන් විවාහය පිළිබඳ යම් අදහසක් ද නැතිවා නො වෙයි.

ඊනියා වික්ටෝරියානු කුහක සදාචාරයක් අද සිංහල සමාජයෙහි නැති බව ද අපි පෙන්වූයෙමු. වික්ටෝරියානු කුහක සදාචාරය එංගලන්තයේ ඇතිවූයේ පැරණි යුරෝපීය වැඩවසම් සමාජයෙහි විවාහය පිළිබඳ තිබූ ආකල්ප ප්‍රසිද්ධියේ පවත්වාගෙන යන අතර අළුත් සමාජයෙහි ඒ පිළිබඳ ආකල්ප අප්‍රසිද්ධියේ පවත්වාගෙන යෑම හේතුවෙනි. අපට එවැනි ප්‍රශ්නයක් නො වී ය. අපේ එකල සමාජයෙහි අද ඇතැමුන් හඳුන්වනු ආකාරයෙන් ලිහිල් විවාහ ක්‍රමයක් නො තිබුණි. ඔවුන්ට අනුව ඊනියා වික්ටෝරියානු කුහකත්වය අපි බ්‍රිතාන්‍යයන්ගෙන් ලබාගත්තෙමු. එහෙත් අප වික්ටෝරියානු කුහකත්වය ඇති කරගෙන ඇතැයි කිව නොහැකි වන්නේ යුරෝපීයන් පැමිණීමට පෙර යුරෙපීය වැඩවසම් කතෝලික ආකල්ප මෙරටට හඳුන්වා දී නොතිබුණු බැවිනි.

එසේ නම් අප අද සමාජය විකාශය වී ඇති ආකාරය තේරුම් ගන්නේ කෙසේ ද? ඇතැම් පුද්ගලයන්ගේ චරිත දෙස බැලීමෙන් අපට පෙනී යන්නේ ඔවුන් බටහිර අනුකරණයකිරීමට නැඹුරු වී ඇති තරම ය. එහෙත් අපට වැදගත්වන්නේ අද අප සමාජයෙහි පවතින දුසිරිත් මෙලෙස පැතිරී ගොස් ඇත්තේ කෙසේ ද යන්න දැනගැනීමට ය. මේ තත්වය පසුගිය අවරුදු පන්සීයක පමණ කාලයකට පෙර ඇරඹුණු යුරෝපීය ජීවන රටව මෙරටට බලහත්කාරයෙන් පැටවීමට උත්සාහ ගැනීමත් පසුගිය අවුරුදු විසිපහක පමණ කාලයක ඊනියා විවෘත ආර්ථිකය ඔස්සේ සමාජය වෙනස්කිරීමට ගත් තැතත් සමග බැඳී ඇත.

අද මෙරට සිංහල සමාජයෙහි ආධිපත්‍යය සඳහා සටන්කරන සංස්කෘති දෙකක් වෙයි. එකක් සිංහල බෞද්ධ සංස්කෘතිය වන අතර අනෙක බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ය. පෘතුගීසීන් මෙරට පැමිණි දින සිට මේ තරගය තිබී ඇත. පෘතුගීසීහු ආගමින් කතෝලික වූ නමුදු සංස්කෘතියෙන් එකල නැගී එමින් පැවති යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත්වූහ. ඔවුන්ගෙන් මෙරට කතෝලික ආගම ප්‍රචාරය වූ නමුදු සංස්කෘතියක් ලෙස ගත්කල පැතිරී ගියේ එතරම් වර්ධනය නොවූ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියකි. ඉතා සරලව කියන්නේ නම් කාපල්ලා බීපල්ලා ජොලි කරපල්ලා සංස්කෘතියෙහි ආරම්භකයෝ ඔවුහු වූහ. අද ආතල ගැනීම යනුවෙන් කියන්නේ මේ සංස්කෘතියෙහි අංගයකට ය.

එහෙත් මේ සංස්කෘතිය රට පුරා පැතිරී නො ගියේ ය. අප රටේ ඉහළ පෙළැන්තිය, එනම් පෘතුගීසීන් විසින් ඇතිකරන ලද ඉහළ පෙළැන්තිය අතර මේ සංස්කෘතිය පැතිරී ගිය ද සාමාන්‍ය මිනිසුන් අතර ඒ ව්‍යාප්ත නො වී ය. සිංහල සංස්කෘතියෙහි ධාරා දෙකක් ඇති බව අපි කියා ඇත්තෙමු. එකක් නාග ධාරාව වෙයි. අනෙක යක්ෂ ධාරාව

© Prof. Nalin De Silva

ය. නාග ධාරාව බාහිරින් ලැබෙන ඕනෑම දෙයක් එලෙස ම පිළිගැනීමට සූදානම් ව සිටින අතර යක්ෂ ධාරාව යමක් පිළිගන්නේ පවත්නා සංස්කෘතියට අවශෝෂණය කළ හැකි නම් ය. එසේ පිළිගැනීමේ දී ඒ බාහිර දෙය පවත්නා සංස්කෘතියට අවශෝෂණය කරගැනීමට යක්ෂ ධාරාව උත්සාහ ගනියි. අප සංස්කෘතියෙහි යක්ෂ ධාරව විසින් පෘතුගීසියෙන් ලැබුණු ක්‍රිස්තියානි සංස්කෘතිය ප්‍රතික්ෂෙප කරන ලදී.

එසේ වුව ද නාග ධාරාව විසින් බිහිකෙරෙන අනුකාරකයෝ ඒ සංස්කෘතිය පිළිගත්හ. එහෙත් ඔවුහු සංඛ්‍යාවෙන් සුළුතරයක් පමණක් වූහ. ලංකාවේ කතෝලික ආගම යම් ප්‍රමාණයකට හෝ ව්‍යාප්ත වූයේ ලන්දේසීන් මෙරට පැමිණීමෙන් පසුව වීම පරස්පරයක් ලෙස පෙනී ගිය හැකි ය. එහෙත් එයට හේතුවක් විය. මෙරටට ලන්දේසීන් පැමිණීමෙන් පසුව ගෝවෙන් පැමිණි ජුසේ සාන්තුවරයා මෙරට කතෝලික ආගම ව්‍යාප්තකිරීමෙහි ලා මූලික විය. ඉන්දියානුවකු ලෙස එතුමා ප්‍රචාරය කෙළේ කතෝලික ආගම හා කතෝලික සංස්කෘතිය ය. කතෝලික සංස්කෘතිය ආසියානු සංස්කෘතීන්ට, විශේෂයෙන් ම හින්දු සංස්කෘතියට සමීප විය. විලාසිතා සහිත කාපල්ලා බීපල්ලා සංස්කෘතිය වෙනුවට පිරිමැස්ම, ඉන්ද්‍රිය පිනවීම අගය නොකළ සංස්කෘතියක් එතුමා අතින් මෙරට ප්‍රචාරය කෙරිණි. ලන්දේසින්ගේ රෙපරමාදු ආගමට හා ක්‍රිස්තියානි සංස්කෘතියට වඩා වේගයකින් කතෝලික ආගම හා කතෝලික සංස්කෘතිය මෙරට ව්‍යාප්ත විය.

විශේෂයෙන්ම ලන්දේසීන් කතෝලිකයන් මර්දනය කරද්දී එසේ වීම සැලකිල්ලට ගත යුතු ය. ලන්දේසීන්ගේ තාඩන පීඩනවලට ලක් වූ කතෝලිකයන්ට සහනය සැපයීමට සිංහල බෞද්ධ රජවරුන් ඉදිරිපත්වීම ද මෙහි දී සැලකිල්ලට ගතයුතු ය. මාතලේ ප්‍රදේශයට සමීප වහකෝට්ටේ නම් ගමෙහි සිංහල රජු විසින් එලෙස ගර්හාවට ලක් වූ කතෝලිකයෝ පදිංචි කරනු ලැබූහ. මෙරට ලන්දේසීන්ට හා ඉංගිරිසීන්ට තම තමන්ගේ ආගම් වූ රෙපරමාදු ආගම හා ඇංග්ලිකන් ක්‍රිස්තියානිය කතෝලික ආගම තරමට ව්‍යාප්තකිරීමට නොහැකි වීමට එක් හේතුවක් වූයේ ද ජුසේ සාන්තුවරයාගේ ප්‍රතිපත්තිය ය.

පෘතුගීසීන්ට වුව ද මෙරට තම සංස්කෘතිය (යුදෙව් ක්‍රිස්තියානි) හා ආගම (කතෝලික) ව්‍යාප්තකිරීමට නොහැකි විය. කතෝලික ආගම ව්‍යාප්ත වූයේ පෘතුගීසි පාලකයන් මඟින් නොව කලින් සඳහන් කරන ලද ආකාරයට ජුසේ තුමන් විසිනි. පාලන බලය තිබූ පමණින් සංස්කෘතීන් ආගම් ප්‍රචලිතකිරීමට නො හැකි බවට මේ කදිම උදාහරණයකි. අනෙක් අතට මෙරට බුද්ධාගම පැතිරී ගියේ දේවානම්පිය තිස්ස රජු දවස සිට එයට රාජ්‍යානුග්‍රහය ලැබීම නිසා යන කුහක අදහස ද ඒ සමග නිෂ්ප්‍රභ වෙයි. රාජ්‍යානුග්‍රහයක් ඇතත් නැතත් මෙරටට බෞද්ධ සංස්කෘතියක් හඳුන්වා දීම රන්රස මුසුකිරීමක් බව කලින් සඳහන් කෙරී ඇත.

ඉංගිරිසින්ට පාසල් පිහිටුවා කෝල්බෲක් කැමරන් යෝජනා ඔස්සේ විවිධ පියවර ගෙනත් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හෝ ඉංගිරිසින්ගේ ඇංග්ලිකන් ක්‍රිස්තියානි ආගම හෝ මෙරට ව්‍යාප්තකිරීමට නොහැකි විය. එහෙත් පෘතුගීසීන් මෙන් ම අනෙක් යුරෝපීය පාලකයනට ද මත්පැන් සුළු වශයෙන් හෝ ඔවුන්ගේ ආගම් අදහන්නන් අතර ප්‍රචාරයකිරීමට හැකිවිය. එයට හේතුව මත්පැන් ඒ ආගම් සමග යම් පමණකින් හෝ බැඳී තිබීම ය. එසේ වුව ද මත්පැන් වසංගතයක් මෙන් පැතිරී නො ගියේ ය. විශේෂයෙන් ම සිංහල බෞද්ධයෝ මත්පැනට ගිජු නො වූහ.තම සංස්කෘතිය විසින් පිළිකෙව් කෙරුණු මත්පැන සිංහල බෞද්ධයනට පුරුදුකිරීම යුරෝපීය පාලකයන්ට අසීරු කරුණක් විය.

මෙහි දී ඇතැමුන් අසන ප්‍රශ්නයක් වනුයේ පැරණි භාරතයේ හා ලංකාවේ මත්පැන් නොතිබිණි ද යන්න ය. භාරතයේ සෝම පානය, ලංකාවේ සුරනිමල සෙනෙවියා රා බිවූ බව හෝ නාලාගිරි, කඩොල් ඇතුන්ට රා පෙවූ බව ආදිය එකල මේ ප්‍රදේශයෙහි සුරාපානය තිබූ බවට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කෙරෙයි. ශාරතයට බටහිරින් පැමිණි ආර්යයන් සුරා පානය (සෝම පානය) හඳුන්වා දෙන්නට ඇත. එහෙත් පැරණි භාරතීය සංස්කෘතීන් එයට විරුද්ධ වූ බව පන්සිල්වලින් ම පැහැදිලි වෙයි. පන්සිල් බුදුන් වහන්සේ ට ප්‍රථයෙන් ම භාරතයේ පිළිගැනී තිබුණි. සුරාපානය නොකිරීමට ජනතාව පෙළඹවීමක් ද පන්සිල්වල ඇත.

ලංකාවෙහි බුදුදහම පැතිරී යෑමෙන් පසුව ද සුරාපානය ඇතැමුන් අතර තිබෙන්නට ඇත. එහෙත් ඒ සමාජ ව්‍යසනයක් ලෙස පැතිරී ගිය බවට ඉතිහාසයෙහි සාක්ෂි නැත. ඇතැම් රජවරුන් අනුරාධපුර යුගයෙහි පසු කලෙක

© Prof. Nalin De Silva

සුරාපානයට ඇබ්බැහි වී ඇති නමුදු ඔවුන්ගේ පාලන සමයන් ද පරිහාණිය ලඟාකර දුන් බව ඉතිහාසයෙහි ඉගැන්වෙන්නේ සුරාව අවමානයට ලක්කරමිනි. සමස්තයක් ලෙස ගත්කල සුරාව සිංහල බෞද්ධයන්ගේ ගැරහීමට පාත්‍ර වූවකි.  එහෙත් අතරින් පතර සුරාපානය කළවුන් මෙරට නො සිටියා නො වේ.

සිංහල බෞද්ධයන් අතර සුරාව පැතිරවීමෙහි ලා සමත්වූවෝ ඉංගිරිසිහු වූහ. ඉංගිරිසිහු විවිධ ක්‍රම මාර්ගයෙන් සුරාව ප්‍රචලිත කළහ. ඔවුහු පළමුව සුරාවට පිළිගැනීමක් ඇතිකළහ. ඉංගිරිසින්ගේ සමාජයෙහි සුරාවට තිබුණේ වැදගත් තැනකි. ඉංගිරිසිහු ප්‍රථමයෙන් ම සුරාවට තිබූ ඒ පිළිගැනීම ඔවුන් අනුකරණය කළ ඉංගිරිසි උගත් තම සේවකයන්ට හා අනුකාරකයන්ට ලබා දුන්හ. සමාජයීය පානයක් (social drink) ලෙස සුරාවට තැනක් දීමෙන් පසු එය වඩාත් පළල්ව සමාජයට හඳුන්වා දීමට ඉංගිරිසිහු කටයුතු කළහ.

බටහිරයන්ගේ මේ ප්‍රතිපත්තිය ලංකාවට පමණක් සීමා වූ එකක් නො වී ය. ආසියාවේ හා අප්‍රිකාවේ රටවල යුරෝපීහු විවිධ උපක්‍රම ඔස්සේ ජනතාව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි කළහ. චීනයේ අබිං පැතිරවීම මේ සඳහා ඇති හොඳම උදාහරණයකි. තම යටත්විජිතවල ජනතාව මතට හුරුකිරීමෙන් යුරෝපීයයන්, විශේෂයෙන් ම ඉංගිරිසීන් බලාපොරොත්තුවූයේ කුමක් දැයි සිතාගැනීම අසීරු කරුණක් නො වෙයි. මත් වූ මිනිසාට යටත්විජිතවාදයට එරෙහිව සටන් කළ හැකි නො වෙයි. මතට ගිජු වූ තැනැත්තා තව තවත් මත සොයා යෑම වැළැක්විය නො හැකි ය.

ලංකාවේ මත්පැන් ව්‍යාප්තකිරීම සඳහා මුල දී ඒ නොමිලේ බෙදාහැරීමට බ්‍රිතානීහු පියවර ගත්හ. ඔවුහු මත්පැන් සමග දුම්බීම ද මෙරටට හුරුකළහ. ලංකාවේ දුම්රිය මාර්ග නිර්මානය කිරීමෙන් පසුව ඒ දිගේ බ්‍රිතානීන් සිගරැට් දැම්මේ යැයි සඳහන් වෙයි. ඔවුන් එසේ කෙළේ තරුණයන්ට සිගරැට් අහුලාගෙන දුම්බීමට හුරුකිරීම සඳහා ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva